# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 මාර්තු මස 17 වන දින පෙ.ව. 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015-02-18 දින අසන ලද ප්‍රශ්ණය:**

**(ප්‍ර/VI (1) /15/01)**

අ) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාසල් වල 2015 වසර සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කරගනු ලැබුවේද?

ආ) එම ඇතුලත් කිරීම්වලට අනුව පාසලක හදුනාගැනීම සඳහා යොදා ඇති පන්තිවල නම් සහිතව එක් එක් පන්තියේ සිටින ළමුන් ගණන හා ඒ ඒ පන්තියේ සම්පූර්ණ කළ හැකි ඉතිරි පුරප්පාඩු ගණන කොපමණදා

ඇ) පුරප්පාඩු සඳහා ක්‍රියාන්විත රාජකාරියේ සිටින පවුල්වල ළමුන් ලෙස අයදුම් කොට අනුමත කර එවා ඇති ළමුන් ගණන ඒ ඒ පාසලට අනුව කීයද?

ඈ) ඒ අනුව ඒ ඒ පන්තිවලට ඇතුලත් කිරීමට හැකියාව ඇති පුරප්පාඩු ගණන කීයද?

ඉ) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගය කවරේද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

**02.** ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015.02.18 දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /15/02)

අ) බස්නාහිර පළාතේ ඒ ඒ කලාප කාර්යාල වලට අනුව 6,7,8,9,10 හා 11 ශ්‍රේණිවල ලිවීම හා කියවීමට නොහැකි ශිෂ්‍යයින් පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ආ) වාර්තාවට අනුව ලිවීමට හා කියවීමට නොහැකි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

ඇ) මෙම ශ්‍රේණි පරාසයන්හි පසුගිය වසර 5 තුළ පාසල් එම අතරමග නැවතුන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

ඈ) ඒ කුමන පාසල් වලද? කුමන ශ්‍රේණිවලද?

**03.** ගරු රොයිස් විජිත ප්‍රනාන්දු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ හා සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /15/06)

අ. (i) බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා විෂයයේ තනතුරු ලබාදීමේ ක්‍රමවේදය කුමක්ද?

(ii) එහි නිලධාරීන් පත් කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ ආවරණය කර තිබේද?

(iii) එහි ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර පරිපාලන සේවයට අයත් නිලධාරියෙකුගේ සේවයට අයත්ද?

ආ. (i) 2013 / 2014 වසර තුල ක්‍රීඩා භාණ්ඩ මිලදී ගත් ක්‍රමවේදය කුමක්ද?

(ii) ලබා ගත් ක්‍රීඩා භාණ්ඩ වල ප්‍රමිතිය සහතික කර තිබේද?

(iii) නියමිත පිරිවිතරයනට පරිබාහිරව ලබා ගත් ක්‍රීඩා භාණ්ඩ සඳහා කරන ලද වියදම් පිළිබඳව සවිස්තර වාර්තාවක් ලබා දිය හැකිද?

(iv) ලබා ගත් ක්‍රීඩා භාණ්ඩ අමාත්‍යාංශයේ ගබඩා කර තිබේද?

ඇ. 2013 / 2014 වසර සඳහා වියදම් පිළිබඳ වාර්තාවක්, පළාත් ක්‍රීඩා විද්‍යායතනය සඳහා යොදන ලද මුදල් පිළිබඳ සවිස්තර වාර්තාවක් තිබේද?

ඈ. මෙම අමාත්‍යාංශයේ, 6/2006 රාජ්‍ය වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමට අනුව ලබාදී ඇති චක්‍රලේඛයේ නිර්දේශයන්ට අනුගතද? ඒ සඳහා ලබාදී ඇති නිර්දේශ අනුව ලබා දී ඇති වැටුප් හා වැටුප් තලවල පිහිටුවීම පිළිබඳව සවිස්තර වාර්තා ඉදිරිපත් කිරීමට හැකිද?

**04. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති. පළාත් මාර්ග,නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා, වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(ප්‍ර/VI (1) /15/07)

අ) ගරු නිමල් ලාන්සා අමාත්‍යතුමා V වන පළාත් සභා කාලය තුළ දරන ලද විෂයයන් භාර අමාත්‍යවරයා වශයෙන් තම ධුරයේ කටයුතු සඳහා විදේශ ගත වූ අවස්ථා ගණන කියද?

ආ) විදේශ ගත වූ රට , කුමන දිනවලද? ඒ අනුව විදේශ ගතව සිටි දින ගණන කවරේද?

ඇ) එකී දිනයන්හි සහභාගී වූ වැඩ සටහන් කවරේද?

ඈ) අමාත්‍යවරයා සමග විදේශ සංචාර වෙනුවෙන් සහභාගීවූ අනෙකුත් අය කවුරුන්ද?

ඉ) ඒ ඒ සංචාර සඳහා වැයකළ මුදල කොපමණද?

ඊ) සංචාරයන් සඳහා වැයකළ මුළු මුදල කොපමණද?

උ) ඒ ඒ සංචාර මගින් පළාත් සභාව වෙත ලැබුණු ප්‍රතිලාභ කවරේද?

ඌ) නොඑසේ නම් ඒ මන්ද?

**05. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(ප්‍ර/VI (1) /15/08)

අ) මීගමුව අධ්‍යාපන කළාපයට අයත් ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රාථමික විදුහලේ විදුහල්පතිවරයාඑම පාසැලට අදාළ සුදුසුකම් තිබේද?

ආ) තිබේ නම් එම සුදුසුකම් ලබා ගත්තේ කුමන වර්ෂයේ පැවති විදුහල්පති විභාගයෙන්ද?

ඇ) එහිදී ඔහු ලැබූ ලකුණු ප්‍රමාණය කවරේද?

ඈ) ඔහු සහ තවත් ගුරුවරුන් දෙදෙනෙකු දරුවන්ගේ මානසිකත්වය බිඳවැටෙන අයුරින් පාසැල තුළ කටයුතු කරන බවට ඔබතුමා වෙත පැමිණිලි ලැබී තිබේද?

ඉ) එසේ නම් ඒ සඳහා ඔබතුමා ගෙන ඇති පියවර කුමක්ද?

ඊ) එසේ නොමැති නම් ඒ පිළිබඳව විමර්ශනයක් සිදුකරන්නේද?

උ) මෙම විදුහල්පතිවරයා විසින් පන්තිලේඛවලට පටහැනි ලෙස මුදල් එකතු කිරීම පිලිබඳව විමර්ශනයක් සිදුකරන්නේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන් දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අයකිරීම් සිදුවේ. පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත්කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මෙලෙස මුදල් එකතුකිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්වී ඇත. එබැවින් බස්නාහිර පළාත තුල දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මුදල් එකතුකිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

(යෝ/VI (1) /14/09)

### 02. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත්කර ගැනීමේදි දරුවන් හා දෙමවුපියන් පීඩාවට පත්කරන වර්තමාන ක්‍රමවේදය වෙනස්කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුලත්කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වූවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුලත් කර ගත් දිනයේ සිට සති 3 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛණයට අනුව ළමුන් ඇතුලත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරීමත්, සම්මුඛ පරීක්ෂණ වලට සහභාගි වන සෑම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙලට අනුව සකස් කිරීමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුලත් කිරීමට පියවර ගැනීමත් කළ යුතුයැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුලත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ /VI (1) /14/10)

## X. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.03.04 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.